සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## ඉස්ලාම් ධර්මය - I

නම/විභාග අංකය :- ........................................................... කාලය: පැය 01 යි.

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) "අර්රූහානිස්යාත්" හි අඩංගු නොවන කරුණකි.
(1) මලක්වරුන් (2) කලාකද්ර් (3) ජින්වරුන් (4) රූහ්

(02) නබිවරුන් හා ආගම් පිළිබඳ විශ්වාසය ඇතුළත් වන මාතෘකාව,
(1) අල්ඉලාහිස්යාත් (2) අස්සම් ඉස්යාත් (3) අන්නුබුව්වාත් (4) අර්රූහානියියාත්

(03) මු: මින්වරයෙකු සතු තිබිය යුතු ප්‍රධාන කරුණු දෙක,
(1) ඊමාන් හා ඉඛ්ලාස් (2) ඊමාන් හා දික්ර් (3) ඊමාන් හා තස්කියා (4) ඊමාන් හා අමල්

(04) ෂීද් (අලෛ) තුමාහට ප්‍රදානය කරන ලද සුහුෆ් සංඛ්‍යාව
(1) 50 කි. (2) 30 කි. (3) 20 කි. (4) 10 කි.

(05) "මිනිසා දේව නියෝජිතයා" යන අරුත දෙන පදය
(1) රසූලුල්ලාහ් (2) කලීෆතුල්ලාහ් (3) කලීලුල්ලාහ් (4) රූහුල්ලාහ්

(06) රුකූ: වලින් පසුව එළඹෙන ඉරියව්ව,
(1) ඉෆ්තිරාෂ් (2) ඉඃ තිදාල් (3) ජුලූස් (4) තහ්රීම්

(07) ඉබ්රාහීම් (අලෛ) තුමාට ලැබූ සුහුෆ් ගණන,
(1) 20 කි. (2) 30 කි. (3) 10 කි. (4) 50 කි.

(08) මාඋත් තහූර් සඳහා උදාහරණයක් නොවන්නේ,
(1) තැඹිලි වතුර (2) ගංවතුර (3) උල්පත් දිය (4) වර්ෂාව

(09) ජලයෙහි කුල්ල තෙතේ ප්‍රමාණය,
(1) ලීටර් 220 (2) ලීටර් 210 (3) ලීටර් 230 (4) ලීටර් 199

(10) "පිරිසිදුකම ඊමානයේ අඩක්" යනු,
(1) අල්කුර්ආන් වැකියකි. (2) සහාබි වදනකි. (3) ඉමාම් වදනකි. (4) නබි වදනකි.

(11) ෆර්ලු කිෆායා සඳහා නිදසුනකි,

(1) පස්වේල් සලාතය (2) දෙමාපියන්ට සැලකීම

(3) කාන්තා වෛදවරියන් බිහි කිරීම (4) පවුල නඩත්තුව

(12) "රිසාලත්" යනු,

(1) දූත මෙහෙවර (2) නැමදීම (3) ඒකීයත්වය (3) පාලනය කිරීම

(13) සිත හා සම්බන්ධ ඉබාදතයකි,

(1) සකාත් (2) ඉඛ්ලාස් (3) සලාත් (4) කුර්ආන්

(14) මෘදු නජිස්හි අඩංගුවන දෙයකි,

(1) බල්ලා

(2) මුත්‍රා

(3) මවුකිරි පමණක් ආහාර ලෙස ගන්නා පිරිමි දරුවාගේ මුත්‍රා

(4) වමනය

(15) මු : මින් කාෆිර් අතර වෙනස සඳහන් කරන ඉබාදනය,

(1) සවම් (2) හජ් (3) සකාත් (4) සලාත්

(16) "මුහාෆලතුස්සලාත්" යනු සලාතය,

(1) සුරකීම (2) අත්හැරීම (3) කඩින් කඩ ඉටු කිරීම (4) විනාශ කිරීම

(17) අවසන් අත්තහිස්යාත් හිඳුම

(1) ඉෆ්තිරාෂ් (2) ජුලුස් (3) කියාම් (4) තවර්රුක්

(18) අල්ලාහ් මිනිසාහට විධිමත් කළ වගකීම්වලට අඩංගු නොවන අංගය,

(1) ඉබාදත් (2) කිලාෆත් (3) ඉරාදත් (4) ඉමාරත්

(19) "මාඋන් මුත්ලක්" යන පදයට සමාන පදයක් වන්නේ,

(1) මාඋල් කලීල් (2) මාඋල් කසීර් (3) මාඋන් තාහිර් (4) මාඋන් නජිස්

(20) "තස්කියා" යන්නෙහි අරුත

(1) ඇල්මක් නොමැති ජීවිතය (2) රැකිම

(3) පිරිසිදු චේතනාව (4) පිළිවෙල කිරීම.

(ලකුණු 2 x 20 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## ඉස්ලාම් ධර්මය - II

නම/විභාග අංකය :- ............................................................ කාලය: පැය 02 යි.

- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20ක් ද, අනෙකුත් එක් එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමිවේ.

(01) කෙටි පිළිතුරු සපයන්න.

(i) අල් ඉලාහියියාත් හි අඩංගුවන කරුණු දෙක කුමක් ද?

(ii) නොමග ගිය අකීදා කණ්ඩායම් සතරක් ලියන්න.

(iii) සුහුෆ් පහළ වූ නබිවරු දෙදෙනෙකු හා ඔවුන්ගේ සුහුෆ් ගණන ද සඳහන් කරන්න.

(iv) ශරීරය හා ක්‍රියාව සම්බන්ධ ඉබාදතයන් දෙකක් නම් කරන්න.

(v) ෆර්ලු අයින් සඳහා නිදසුන් දෙකක් ලියන්න.

(vi) තයම්මුම් කිරීමට අවසර ඇති අවස්ථා දෙකක් සඳහන් කරන්න.

(vii) අල්මාඋල් මුත්ලක් යනු කුමක් ද?

(viii) සුජුද් හි ස්පර්ශවන අවයවයන් සතරක් සඳහන් කරන්න.

(ix) රුකූඋ හි පාරායනය කරන දුආව ලියන්න.

(x) අකීදාවෙහි පිවිතුරුභාවය ආරක්ෂා කිරීමට සමත්කළ ඉමාම්වරු දෙදෙනෙකු නම් කරන්න.

(ලකුණු 02 x 10 = 20)

(02) (i) ධනය හා සම්බන්ධ ඉබාදත් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) මුඃමින්වරයකුගේ ක්‍රියාකාරීත්වයට අදාළ කොන්දේසීන් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) ඉබාදත්හි අරමුණු පහක් සඳහන් කරන්න. (ලකුණු 05)

(03) (i) අල්මාඋත්තාහිර් සඳහා නිදසුන් සතරක් ලියන්න. (ලකුණු 02)

(ii) අල්මාඋක් තහුර්හි කොටස් තුන කුමක් ද? (ලකුණු 03)

(iii) දෛනික ක්‍රියාකාරකම් ඉබාදත් වීමට ඉස්ලාම් පවසන කොන්දේසීන් පහක් සඳහන් කරන්න.

(ලකුණු 05)

(04) (i) බල්ලා සහ ඌරා හැර අනෙකුත් සතුන්ගේ සම් පිරිසිදු කරන ආකාරය සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) නජීස් වර්ග කොට නිදසුන් සමඟ පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) සලාතය ඉටු කිරීම මගින් ලබාගත හැකි ප්‍රයෝජන පහක් සඳහන් කරන්න. (ලකුණු 05)

(05) (i) සුන්නත් කටයුතු දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) සලාතයේ වැදගත්කම අල්කුර්ආන් හා සුන්තා මගින් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) සලාතයෙන් අනතුරුව පාරායන කළ යුතු පාරායනයන් පහක් සඳහන් කරන්න. (ලකුණු 05)

(06) (i) ආගම් පහළ වූ නබිවරුන් සහ ඔවුන්ගේ ආගම ද සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) රිසාලත්, හිදායත් යන පද දෙක විස්තර කරන්න. (ලකුණු 03)

(iii) සිතෙහි කොටස් තුන සඳහන් කර ඒ අතරින් එකක් ගෙන විස්තර කරන්න. (ලකුණු 05)

(07) පහත සඳහන් මාතෘකාවන් අතරින් දෙකක් තෝරා කෙටියෙන් විස්තර කරන්න.

(i) ෆර්ලු කිෆාසා

(ii) පිරිසිදුකමේ වැදගත්කම

(iii) අත්තස්කියා

(iv) ඊමාන් සහ අමල් (ලකුණු 05 x 2 = 10)